

# සිංහල

# මේඝදූත කාව්‍යය.

# සිංහල මේඝදූත කාව්‍යය

'සඳකෝමලී'
කතෘ තැන්පත්
මුල්ලපිටියේ

**කේ. එච්. ද සිල්වා මහතා**

විසින්
විරචිතයි

ශ්‍රීමත් කාලිදාශ මහා කවීන්ගේ
**සංස්කෘත මේඝදූතය**
සහිතයි

බෙන්තර
**ආනන්ද ධර්මදර්ශී ශ්‍රී සරණඞ්කරාභිධාන**
නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
විසින් ලියනලද
සාරගර්භි ප්‍රස්තාවනාවෙන්
යුක්තයි.

# SINHALESE MEGHA DUTA

(Cloud Messenger)

---

BEING A TRANSLATION
OF
**Sri Kalidasa's Sanscrit Poem.**
BY
**Mullapitiye K. H. De SILVA**
Author of
'SANDA KOMALI'
(Lovely Moon)


පී. කේ. ඩබ්ලිව්. සිරිවර්ධන,
[වෙල්ල වීදියේ අංක 62,]
**පොත්පත් සළු කාරණ වෙළඳ තැන**
විසින්
ප්‍රකාශිතයි.

**1934.** **මිල ශත 25.**

විද්‍යානන්ද, විද්‍යාසාගර යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

RESPECTFULLY DEDICATED

TO

J. R. WALTERS Esq., B.A., C.C.S,

POSTMASTER GENERAL

AND

DIRECTOR OF TELEGRAPHS

CEYLON.

# ප්‍රස්තාවනාව

'**මේඝදූත කාව්‍යය**' නම්වූ මේ කවි පොත මහ කවි කාලිදාසයන් විසින් විරචිත "මේඝදූත" නම්වූ සංස්කෘත කාව්‍යගත ශ්ලෝකාර්ථයන් සිංහල භාෂාවට පරිවර්තනය කිරීමෙන් රචනාකරණ ලද සිංහල පද්‍ය කාව්‍යයකි.

මෙහි මූල ග්‍රන්ථයවූ "මේඝදූත" නම් සංස්කෘත කාව්‍යය මීට අවුරුදු 1980 කින් පමණ පූර්වයෙහි **මාලව** දේශයෙහි **උජ්ජයිනී** නම් රාජධානියෙහි රජකළ **වික්‍රමාදිත්‍ය** රජුගේ විබුධ සංසද් තිලකතා:—

"ධන්වන්තරිඃ ක්ෂපණකෝ'මරසිංහශඞ්කු
වේතාලභට්ට ඝටඛර්පර කාලිදාසාඃ
ඛ්‍යාතෝ වරාහමිහිරෝ නෘපතේඃ සභායාං
රත්නානි වෛ වරරුචිර්නව වික්‍රමස්‍ය."

යන මේ ශ්ලෝකයෙහි නිර්දිෂ්ට පණ්ඩිතාචාර්යයන් නවදෙනා අතුරෙහි පෙණෙන කාලිදාස කවිවරේණ්‍යයන් විසින් විරචිත බව බහුතර සම්මතයි. ඒ සඳහා දක්වන ලද ඉතිහාස කථාවකුදු මෙසේ ඇත්තේය:—

වික්‍රමාදිත්‍ය රජහුගේ කාලයෙහි කිසියම් බ්‍රාහ්මණ කන්‍යාවක් තොමෝ අතිශයින් පණ්ඩිතවූවා තමා විවාහය පිණිස පියානන් විසින් ගෙන්වන ලද සුදුසුකම් ඇති සියලු බ්‍රාහ්මණ දරුවන් වාද කිරීමෙන් පැරදවූවාය. පැමිණි පැමිණි සියලුදෙනා ඇගෙන් පරාජයට පැමිණි ආපසු හැරීගියකල, ඒ ඇසූ අන්‍යයෝද පරාජයට භයින් කිසිවෙක් නොපැමිණියාහුය. ඉන් පසු පිය බමුණහු විසින් වාදයක් නොමැතිව පැමිණි සුදුස්සෙකුට දියයුතුයයි නියම කරණ ලද්දේය. පළමු පුරුෂයන් පැමිණවූ දූතයෝ ඇය ගේ ක්‍රියාවෙන් නොසතුටුව ඊර්ෂ්‍යා සහිත වූවාහු ඇය නුවණ මද එකෙකුට විවාහ කරණු සඳහා සොයන්නෝ, ගසක උඩින් එල්බ පහතින් අත්තක් කපන කාලිදාසයන් දැක ඔහු ගෙණවුත් පිය බමුණන්ට මොහු සුදුසුයයි භාරදුන්නෝය. පිය තෙමේද කිසිවක් නොසොයා දුවනිය කාලිදාසට පාවා දුන්නේය. විවාහවූ පසු දෙදෙනාගේ කථා කාලයෙහි කාලිදාස පුරුදු අපභ්‍රංශ වචන කථා කළේයි. කුමරී තොමෝ ඔහුට අපහාස කොට ගෙන් පිට කළාය.

මෙසේ භාර්යාව විසින් බැහැර කරණ ලද කාලිදාස තෙමේ අධික දුකට පැමිණ වල්වැදී සරස්වතී ප්‍රසාදය ලැබ ශාස්ත්‍ර ප්‍රවීණව

සිය බිරිඳගේ නිවසට පැමිණ රාත්‍රියෙහි දොර වසා තිබෙනු දැක "අනාවෘතක පාටං වාරං දෙහි" (දොර ඇර දෙව්) යන වාක්‍යය කීයේය. භාර්‍යා තොමෝද කටහඬින් තම වල්ලභයා හැඳින "අස්ති කශ්චිත් වාග්විශෙෂඃ" යි (කිසියම් ශාස්ත්‍ර විශෙෂයක් ඇතිද යනු ඇසුවාය). කාලිදාස තෙමේද, එහි තුබූ වචන තුණ වෙන් කොට "අස්ති" යන වචනය මුල් කොට:—

"අස්ත්‍යුත්තරස්‍යාං දිශිදෙවතාත්මා
හිමාලයො නාම නගාධිරාජඃ
පූර්වාපරෞ තොය නිධී වගාහ්‍ය
ස්ථිතඃ පෘථිව්‍යා ඉවමාන දණ්ඩඃ."

යන මේ ශ්ලොකයෙන් පටන්ගෙණ සතළොස් සර්ගයකින් **කුමාර සම්භව** නම් මහා කාව්‍යයද, දෙවන "කශ්චිත්" යන වචනය මුල්කොට:—

"කශ්චිත් කාන්තා විරහ ගුරුණා ස්වාධිකාර ප්‍රමත්තඃ" යනු ආදී ශ්ලොකයෙන් පටන්ගෙණ **මෙඝදූත** කාව්‍යයද, "වාග් විශෙෂඃ" යන වචනයෙන් "වාග්" යන වචනය මුල්කොට:—

"වාගර්ථාවිව සම්පෘක්තෞ වාගර්ථප්‍රතිපත්තයෙ,
ජගතඃ පිතරෞ වන්දෙ පාර්වතී පරමෙශ්වරෞ."

යන ශ්ලොකයෙන් පටන්ගෙණ සර්ග දශනවයකින් රඝුවංශ කාව්‍යයද කොළේය. යනු එහි සඳහන්වේ.

මේ කියනලද වික්‍රමාදිත්‍ය රාජ කාලයෙහි විසූ කාලිදාස කවීන්ද්‍රයන් විසින් කරණලද ග්‍රන්ථයෝ බොහෝ වෙත්. යථොක්ත **කුමාරසම්භව, මෙඝදූත, රඝුවංශ** යන කාව්‍යත්‍රය හා, **සඃකුචන්ද්‍රිකා** නම් වෙද ග්‍රන්ථය, **ජ්‍යොතිර්විදාභරණ** නම් ජ්‍යොතිර්ග්‍රන්ථයද, **වික්‍රමොර්වශී, මාලවිකාග්නිමිත්‍ර, ශකුන්තලා** නම් නාටක කාව්‍යයෝද, **ඍතුසංහාර, නලොදය** යන මේ ග්‍රන්ථයද යථොක්ත කාලිදාසයන් විසින් කරණලදහයි ප්‍රසිද්ධයි. එහෙයින් රාජ සභාවෙහි රත්නාභිධ පණ්ඩිත නවදෙනා අතුරෙහි මහා කවිත්වයෙන් කාලිදාසයෝම අග්‍රෙසර වූහ.

මින් පසුවද හොජ රාජ සභ්‍ය කාලිදාස කවිවරයෙක්ද, ඉන් පසුව **ජගන්නාථමිශ්‍ර** කාලිදාස කිවිවරයෙක්ද ප්‍රසිද්ධියට පැමිණියෝය. තවත් කාලිදාස නමින් ප්‍රකට වූවෝ විසූහ යනු ඝොශ් චිනමතානුසාර වුවද, ඒ සඳහා කරුණු දැක්වීමට හේතු නොපෙණෙත්. මෙඝදූත කාව්‍යය වනාහි වික්‍රමාදිත්‍ය රාජසභ්‍ය ප්‍රාචීන කාලිදාසයන් විසින් ම රචිත බැව් නිශ්චිතයි.

"මේඝදූත කාව්‍යය" මහා කාව්‍යයයිද ඛණ්ඩ කාව්‍යයයිද, ද්විප්‍ර භේදයකි — එයින් තර්කවාචස්පතීන් විසින් ස්වකෘතාභිධානයෙහි "ඛණ්ඩකාව්‍යය" යි කියනලදි. "සර්ගබන්ධෝ මහාකාව්‍යම්" යනු සූත්‍රානුගත නුවූ හෙයින් එසේ කියන ලදැයි සිතිය හැක්කේය. මේඝදූතයද පූර්ව මේඝ උත්තර මේඝ කාණ්ඩද්වයකින් යුක්තවූ හෙයින් සර්ගබන්ධය ඇතැයි කිවහැකි වුවත් ප්‍රමාණන්‍යූනතාව එය වළක්වයි. මහා කාව්‍යයෙහි:—

"අෂ්ටසර්ගාන්නතුන්‍යූනං ත්‍රිංශත් සර්ගාච්ච නාධිකම්,
මහාකාව්‍යං ප්‍රයෝක්තව්‍යං මහාපුරුෂ කීර්තියුක්."

යනුවෙන් කියනලද සර්ග අටකින් අඩු නොවීමද තිසකින් වැඩි නොවීමද ප්‍රමාණය වේ.

කිසිවෙක් මීට වෙනස් කොටද කියත්. මහා කාව්‍යයෙහි සර්ගයෝද භින්නවෘත්තාන්ත වියයුතුයි. මේඝදූත කාව්‍යය ආරම්භයේ පටන් අවසානය දක්වා කාණ්ඩද්වයම මන්දාක්‍රාන්තා වෘත්තයෙන්ම රචිත හෙයින් භින්න වෘත්තාන්තත්වයද නොමැත්තේය. මෙසේ මහා කාව්‍යාංග සර්වස්ව විරහිතත්වයෙන් තර්කවාචස්පතීහු 'ඛණ්ඩකාව්‍ය" භාවයෙහි ගිණූහ.

ටීකාකාර මල්ලිනාථයෝ මේඝදූතය මහා කාව්‍යයයි කීවෝය. "අත්‍ර නගනගරාර්ණවාදි සද්භාවාන්මහාකාව්‍යත්වම්" යනු මල්ලිනාථයන්ගේ කීමයි. මෙහි පර්වත නගර සමුද්‍ර වර්ණනාදිය ඇත්තෙන් මහා කාව්‍යත්වයයි යනු එහි අදහසයි. මහා කාව්‍යයෙහි වර්ණනා විශේෂයන් දක්වන ශ්‍රී දණ්ඩ්‍යාචාර්යයෝ:—

"නගරාර්ණවශෛලර්තු චන්ද්‍රාර්කෝදය වර්ණනෛඃ
උද්‍යානසලිල ක්‍රීඩා මධුපානරතෝත්සවෛඃ."

යන මේ ආදී ශ්ලෝක කීපයකින් වර්ණිතව්‍යයන් කීහ. එහි දක්වනලද වර්ණනා විශේෂයෝ මේඝදූතයෙහි බෙහෙවින් ඇත්තාහ. දණ්ඩීන් විසින්ම:—

"න්‍යූනමප්‍යත්‍ර යෛඃ කෛශ්චිදඞ්ගෛඃ කාව්‍යං න දුෂ්‍යති
යද්‍යුපාත්තේෂු සම්පත්තිරාරාධයති තද්විදඃ."

යනු දැක්වීමෙන් යම්කිසි අඞ්ගයකින් න්‍යූනවුවද කාව්‍ය දූෂණයක් නොමැති බව කියනලදි. එහෙයින් නග නගරාදි වර්ණනා සද්භාවයෙන් මහා කාව්‍යත්වය සිද්ධයයි සිතිය හැකියි. තවද මේඝ දූතය "සඞ්ඝාත" කාව්‍යයක් බවද මහා කාව්‍යත්වයට කරුණු වේ. සඞ්ඝාත කාව්‍ය නම්:—

"යත්‍ර කවිරේකමර්ථං වෘත්තේන නෛකේන වර්ණයති කාව්‍යෙ,
සඞ්ඝාතඃ සනිගදිතො වෘන්ද වන මෙඝදූතාදිඃ."

යනු දක්වූ හෙයින් මෙඝදූත කාව්‍යයෙහි අභිප්‍රේතාර්ථය එකම මන්දාක්‍රාන්තා වෘත්තයෙන් විරචිත හෙයින් සඞ්ඝාත කාව්‍යයයි. සඞ්ඝාත කාව්‍යයද මහා කාව්‍ය සම්බන්ධයෙන් මල්ලිනාථයන්ගේ මහා කාව්‍යත්ව නිරූපනයද නිරවද්‍යයයි හැඟේ.

මෙහි කථා ශරීරය නම් අලකාධීශ්වරයන් විසින් තමන් මෙහෙකරු යක්ෂයෙක් හට ස්වස්ථානාන්තර විරෝධව කරණලද දොෂ හෙතුවෙන් රෝෂිව ඒ යක්ෂ තෙමේ නො ඉවසිය හෙන දඬුයමක් කිරීම් වශයෙන් ස්වප්‍රියාවගෙන් වෙන් කොට රාම ගිර්‍ය්‍යාශ්‍රම නම්වූ චිත්‍රකූට පර්වතයෙහි හවුරුද්දක් නියමයෙන් තබන ලද්දේය. යක්ෂ තෙමේද තමන් කාය චිත්ත වෘත්තිය ස්ව ප්‍රියාව වෙත මෙඝයක් දූත ක්‍රියාවෙහි යොදා කියා එවූයේය යනුයි.

මෙය වනාහි ශ්‍රී රාමයන් සීතා විරහයෙන් විසූ සමයෙහි හනුමතුන් අත ස්ව ප්‍රියාව වූ සීතාවට ස්වචින්තා විශෙෂ දන්වා එවන ලද්දද අභවා කරණලද අන්‍යොක්තියකැයි මල්ලිනාථයෝ කියති. පුරාණ ව්‍යාඛ්‍යාකාරයෝ, "රම්ගිරි අසපුවෙහි විසූ යක්ෂ යාගේ ස්ථානයෙහි තමන් තබා යක්ෂ පත්නී ස්ථානයෙහි ස්වකීය කාන්තාව ආරොපිත කොට අන්‍යොක්තීන් මේ කාව්‍යය කියපී වූවාහු"—යන්නෙන් ස්ව ප්‍රියාවගෙන් වෙන්ව වල්වැද විසූ කාලිදාසයෝ තමන් යක්ෂ ස්ථානයෙහිද, විරහයෙන් වුසූ කාන්තාව යක්ෂ පත්නී ස්ථානයෙහිද යොදා අන්‍යොක්තීන් මේ කාව්‍යය රචනා කළෝයයි කීයුහු. මතවයෙහිම අන්‍යාලාපය අවිරුද්ධ, නොවේ. ග්‍රන්ථය වනාහි මෙඝය දූත ක්‍රියායෙහි යොදා කරන ලද හෙයින් "මෙඝදූත" නම් විය. මෙය දූත ප්‍රයානය ප්‍රධානත්වයෙන් ගත් හෙයින් "දූත කාව්‍ය" යයිද කිව යුතු වේ. දූතයෝද ත්‍රිවිධ වෙත්. ඔහු නම්:—

"නිසෘෂ්ටාර්ථො මිතාර්ථශ්ච තථා සන්දෙශ හාරකඃ
කාර්‍ය්‍යප්‍රෙෂ්‍ය ස්ත්‍රිධාදූතො දූත්‍යශ්චාපි තථා විධඃ" ඉති.

දක්වූ හෙයින් මෙහි සන්දෙශ හාරක දූත තෙමේ ගෘහිතයි— පරේඞ්ගිත ඥත්වාදි ගුණාඞ්ග සඞ්ගත දූතයෙක් දූත ක්‍රියාවෙහි යෙදිය යුතුය යනු ශාස්ත්‍රාකාහි හෙයින් තද්ගුණ සමාරොපණ යෙන් මෙඝයා දූත ක්‍රියාවෙහි යොදා මෙඝදූත කාව්‍යය රචනා කරණ ලදැයි දතයුතු.

යථොක්ත සංස්කෘත මෙඝදූත කාව්‍යය, වනාහි සන්දේශග්‍රන්ථ [illegible] විදග්ධාරාධනයට හිතවූ කාව්‍යාඞ්ග සම්පූර්ණ

ප්‍රශස්තතර කාව්‍යරත්නයක යනු සර්වසම්මත හෙයින් ඒ සඳහා නොවෙහෙසෙමු. සිංහල මේඝදූත කාව්‍යය කවි 122 කින් නිමවන ලද්දකි. යථෝක්ත සිංහල භාෂාමය මේඝදූත කාව්‍යයෙන් මූලාශ්‍රිත ග්‍රන්ථයෙහි අර්ථ විජානනයද, දූත කාව්‍ය නිර්මාණයෙහි ප්‍රවීණත්වයද, නිරායාශයෙන් සිඬකටගත හැකි බැව් කීමට මැලි නොවෙමු.

රචනාව වනාහි මූල ග්‍රන්ථයෙහි භාවය දැක්වීම ප්‍රධානකොට කරණ ලද බැව් පොත බැලීමෙන් අවබොධ වෙයි. එසේ නොවී නම් මීට වඩා විශාල ග්‍රන්ථයක් වනු නො අනුමානයි. මේ සිංහල මේඝදූත කාව්‍යය ආධුනිකයන්ගේ ප්‍රඥා වර්ධනයටද සුධීන්ගේ සන්තුෂ්ටි ප්‍රාප්තියටද හේතු වේවායි ආසංසනය කරම්හ.

බෙන්තර,

ආනන්ද ධර්මදර්ශී ශ්‍රී සරණඞ්කරාභිධාන

ප්‍රධාන නායක ස්ථවිර.

ශ්‍රී බුද්ධ වර්ෂ 2476 ක් අව තෙලෙස්වක්
ලත් ක්‍රිස්තු වර්ෂ 1933 අප්‍රේල් 22 වෙනි
දින බෙන්තර ගලපාත රජමහ
විහාරස්ථ ශෛලානන්දායතන
පිරිවෙණෙහි දීය.

# සංඥාපනය.

භාෂාවකගේ සාහිත්‍යය පුෂ්ටිමත් කිරීමට අන්‍යවූ ශිෂ්ට භා වන්ගේ සුප්‍රසිද්ධ කෘතීන් පරිවර්තනය කිරීමද, බෙහෙවින් අ ශ්‍යක වේ. අද අතිමාත්‍ර උච්චස්ථානයකට පැමිණී තිබෙන ඉං භාෂාවේ ශීඝ්‍රතර දියුණුව මීට නිදර්ශන කොට දැක්විය හැ සිංහල භාෂා තොමෝද ස්වකීය සාහිත්‍යයාගේ දීප්තිමත් භාව වර්ධනය කරගැණීමට මින් උපකාර නොලැබුවා නොවේ. එ එය සීමා සහිතවූවකි.

අපරදිග මහාකවීන්ගේ ශ්‍රෙෂ්ට කෘතීන් තබා අප පි විශෙෂයෙන් දතයුතුවූ පෙරදිග, ඉනුත් භාරතීය ග්‍රන්ථරත්නද වත් අපට අපේ භාෂාවෙන් හැදෑරිය නොහැක. අවරදිග ම පඬුවෝ අන්‍යවූ ශිෂ්ට භාෂාවන්ගේ ග්‍රන්ථ රත්නයන් ඒවූ පරිද ස්වකීය භාෂාවන්ට නඟා ගනිද්දී අපේ බොහෝ ගත් කරු තමහට හමුවූ අන්‍ය භාෂාවල ග්‍රන්ථයන්හි වූ මධුරතර පෙද තමගත්වල ස්වකෘතීන් මෙන් රුවාගත්තාහුය. ඇතමෙක් ශබ්ද සක් කරණු වස් තමතමන්ගේ මතිමාත්‍රද එක්කිරීමෙන් මුලින් තිබූ මධුරකොමලත්වය වනසාදැමූහ. මෙයට බොහෝ සුන් දැක්වියහැක. මින් සාහිත්‍යයට මූල ග්‍රන්ථ ඒවූ පරිද්දෙන් පරිවර්තනය කිරීමෙන් ලැබෙන විශිෂ්ටතර ප්‍රතිඵල නොලැබ ඉන්නිසා ගතානුගතිකත්වය හා වානර අනුගමනය අත්හැර ද සාහිත්‍යයාගේ වර්ධනයට අපේ කවීහු ප්‍රොත්සාහිවියයුතු කාල මේ වෙත්.

මහකවි ශ්‍රී කාලිදාශයන් විසින් විරචිත මේ රමණීය මේ දූත කාව්‍යය සවිස්තර අර්ථ වර්ණනා සහිතව අද ශිෂ්ටවූ බො යුරෝපීය භාෂාවලට පරිවර්තනය කරගත සාදරයෙන් භා කරණමුත්, එය අප හමුවෙහි එතරම් සතුටු දායක තත්ව නැත. මේ කාව්‍යය සහ එහි කර්තෘ සම්බන්ධයෙන් කියයුතු කරු මෙහිම ප්‍රස්ථාවනාවෙහි පෙණෙන බැවින් ඒ ගැණ වැඩි අප විසින් මෙහිදී කියනු නොලැබේ.

සන්දෙශ ලෝකයේ ශ්‍රෙෂ්ටතර පදවිය දරණ මේ අති රම සංස්කෘත කාව්‍යය අප පුරාණාචාර්‍යවරයන් විසින් ගෞරවණ සම්භාවිත බැවි වෘත්තරත්නාකර ව්‍යාඛ්‍යානාදි ග්‍රන්ථාන්තරව පෙනෙන අතරම සිංහල මහාකවි ශ්‍රී රාහුල සංඝරාජයා වහන්සේද උන්වහන්සේගේ දූත කාව්‍ය නිර්මාණයෙහිදී මෙ

ගුරු තැන්හි තබාගත් බව මෙහි 9-35-41-54-64 යනාදි ශ්ලෝකයන් සමග සැලලිහිනි සන්දේශයෙහි පෙණෙන 16-21-51-48-8 යන කවි සසඳ බැලීමෙන් අවබෝධවේ.

මේ මධුරතර අති ප්‍රසිද්ධ කාව්‍යයට ලියනලද පුරාණ සිංහල අර්ථ වර්ණනාවක් ඩී. බී. **ඝාණබොක්කේ** මන්ත්‍රීශ්වරයන් විසින් වර්ෂ 1893 දී සංස්කරණය කොට ප්‍රසිද්ධ කරණලදී. ඒ සංස්කරණය දුරාවබෝධ බැවින්ද, පද්‍ය කාව්‍යයක් පද්‍ය කාව්‍යයකටම පරිවර්තනය කිරීම වඩාත් යෝග්‍ය බැවින්ද, රත්දෙඹේ මහාචෛත්‍ය පිරිවෙන්හි උප ප්‍රධාන රාජකීය පණ්ඩිත වලගෙදර **සෝමාලෝක තිස්ස ස්ථවිර** ස්වාමිපාදයන්වහන්සේ විසින් මෙහෙයනලද අප විසින් මූල ග්‍රන්ථයෙහි අර්ථ හැකි පමණ වෙනස් නොවෙන ලෙස විශේෂ පරිශ්‍රමයෙන් යෙදී මෙය සිංහල කාව්‍යයට නගනලදී.

මෙහි පැණෙන ප්‍රස්තාවනාව කරුණා පූර්වකව ලියාදුන් අපාචාර්ය්‍ය පරම්පරා නැමති මුක්තාවලියෙහි මහාර්ඝ මුක්තාඵලයක් බඳුවූ බෙන්තර ගලපාත රජමහා විහාරස්ථ ශෛලාන්තායතන පරිවෙනාධිපති පණ්ඩිතාචාර්ය්‍ය බෙන්තර ආනන්ද ධර්මදර්ශි **ශ්‍රීසරණංකරාභිධාන** ප්‍රධාන සංඝනායක මාහිමියානන්වහන්සේට හා දුරාවබෝධස්ථාන විසඳීමාදියෙන් අවවාද දුන් අපාචාර්ය්‍ය කළුවාමෝදර බෙතකාරාම කඳෙවිහාරස්ථ ක්ෂේත්‍රාරාම පරිවෙණාධිපති අති ගෞරවාර්හ පොතුවිල **කීර්තිශ්‍රී වාගීශ්වර විනයාචාර්ය්‍ය ශ්‍රී සරණතිස්සාභිධාන** ප්‍රධාන සංඝනායක මාහිමියානන් වහන්සේටද අපේ සාදර ගෞරවස්තුතිය පුදකරමු.

මෙයට,

K. H. De S

Post Office
LINDULA.
14-8-32.

# මෙඝදූත කාව්‍යය.

නමව් මුනි සරණ

1

දෙ ස ත ට  ප මා කිසියම් යකකුගෙ කුවෙ  ර
ව න ස ට  ද මා ඔහු සැම තෙදබල නො හැ  ර
ම න තු ට  ළ මා පියකතගෙන් විරහ ක  ර
ව ස ත ට  සෙමා දඹුවම් යැවි දුරු කත  ර

2

සි නි දු  සිහිල් සෙවනැ ති තුරු සැදි රම  ණී
හ රි දු  තිරිඳ නැහැමෙන් පින් දල ගිහි  ණී
ප සි දු  අසපුවෙහි රම්ගිරි නම් කල  ණී
ස මි දු  අණ සෙ විඳිනට විය විරහ ගි  නී

3

ර න්  මිණි වළලු ගිළිහීමෙන් හිස්වූ ක  ර
ම න්  පෙම්බර සොඳුරි වෙත බැඳි ආ අතැ  ර
කා මි  සැප ලොබින් ගිලෙමින් රු දුක් සයු  ර
ර ම්  ගිරියෙහි විසී ඒ සේවක කුවෙ  ර

4

ග ත වූ න  සඳ මාස ගණනක් මේ කෙමෙ  නි
ලෑ බු දි න  ඇසළ මස හෙබි දළ සහ කුඹි  නී
දි ය සැ න  හෙන රිසිවූ මහ ගජනකු ලෙසි  නී
ස සො බ න  මේ කුළක් දුක ඒ යක් සොවි  නී

5

එ ම න ර  යහන් අතවැසි නොත කඳුලැලි  ක
බොහොකර  බැලී ගත කිරළුන්ට හැබි දෙ  න
පි ය ස ර  සමාගම ඇති අය ද පොළඹ  න
ද ල ද ර  කියනු කිම විරහින් හට දස  න

6

පි ය බ ඳ  වෙනෙහි තම සුවදුක් පැවසුම  ට
මනා නද  අයකු ලදිම් සි දූ මෙහෙවර  ට
ල ද පු ද  නව කෙළි ද කුසුමින් ඒ අබ  ට
හ ද ඔ ද  වැඩි බිණී කන්කළු බස් සතු  ට

7

ඉ දු ර න්  ඇති සතන් ගෙණ යා යුතු සඳෙ  ස
ගි නි දූ මි  සලිල සුළඟින් සැදි මේ කෙළෙ  ස
කා ර නො මි  දැ සි නො දැන යැදි ලිය සොඬ පිස  ස
වි දි ම න්  මද දනි ද පණ ඇති නැති වෙන  ස

8

නි ප න් උතුම් කුල ලෝ වැසි ගරු කර නා
පු ර න් දර සෙනවි රිසි රිසි වෙස් දර තා
ස ප න් කම් දනිමි මම තොප-වියො දුකි නා
ස ව න් දෙව් බසට ගැතිවීමෙන් කිය නා

9

ම ග ත් තෙද ගුණැ ති උතුමකු වෙත පැමි ණී
තොලත් නමුදු පිහිටක් යැද කිසි ලෙසි නී
ප හ ත් අයකු හට ගුණ සුන් ගැති වෙමි නී
සෙ සි ත් ලබන සහයට වැඩියෙන් ගිහි ණී

10

හි රි හැ ර ප තා දියනෙත් තද සැඩ රැසි නා
ද ල ද ර මෙතා සත සතසත සිහිලසි තා
ත ද වෙ ර යු තා යක් රද දුක් දුන් මදෙ නා
පෙ ම් ද ර සා තා වෙත යව මෙහසුන් රැගෙ තා

11

කැ ප වුත යක් රදුන් හට සැදි වනෙහි පි ට
ක ප ලත මුදුන් සොමි සඳරැස් වැද සුම ට
ඔ ප වැඩි පහ පෙළැ නි හෙල කැල්මෙන් රුව ට
තොප යා යුතු ය අලකා නම් පුරවර ට

12

නැ ග ග න තුඹට තුඹ යන කියඹු උස් තො ට
ම ග ය න 'ගන බලන සැනසිලි ලැබ සිත ට
සැ ර සු න මෙ තුඹ දුට අත්හට නොවූ තිව ට
මෙ ම ද න සරි කවුරු දුක් දෙති පියඹුන ට

13

වැ දි වැදි මද පවන තා යන කල සෙමෙ නා
සැ දි වම් පසෙහි සියදද නද රැව් නඟ නා
වි දි ලෙද ගැබි දෙවන තා සෙව් යගදස නා
බැ දි මල් වඩම් වැනි තොක් පෙළ තුඹ සර නා

14

ස ම හ න් සැපත විඳ විඳ සිටිය හිමිස දේ
සි ය තැ න් සිට තියැලි දින ගැණුමෙහි නිබ දේ
නෙදු කින් එක පසින් හෙව වැසි විරහ ඇ දේ
වෙසෙසින් දකුව තගෙ ඒ සොහොයුරිය න දේ

15

ය ළි මි න් අප දෙදෙන පෙම් ඔකඳ සාග රේ
ස තු ටි න් ගිලෙන බව ඇගෙ සිතට නම් නි රේ
වෙසෙසින් බොළඳ මුදු කන සිත කුසුම් යු රේ
නොම දින් දැඩිය පෙම් හැඟුමෙන් යුතුවූ ව රේ

16
ති ර ව ස  නට කදුළු මල් සත්දෙන  සු ර ස
නාගෙගොසස  මින් මන් බැඳි විල වෙත  ම න ස
නු බ කු ස  නැග නෙලුඹු දලි ගෙන මග  පි ණි ස
ර ද ග ස  සබඳ යෙන තොප සහ නෙක්  කෙලෙස

17
මි තු ද මි  පැරණි බැඳි නුඹෙ වියොවින්  සොවින
උ ණු සු මි  කඳුළු කැම හෙලනා මුදු  පෙ මින
ග රු ර මි  පදෙන් කල සලකුණු මෙම  ගි රි න
ගණු පෙම්  බර මිතුර අවසර සිප  බැ තින

18
කා න්  කළු රස හසුන් මතු පවසමි සොඳු  ර
පැ න්  මද සඳෙහි ගෙණ ගහුලැල්ලෙන් නොබ  ර
ස න්  සිදුවන විඩා ගත ගිරි කුලිනි ස  ර
දූ න්  අස න යන මග සලකුණු දෙව් මිතු  ර

19
දි ය  මි දෙ ලි න්  සැදි මෙතැනින් නැග  ග ග න
ඔ ද  දි ගැ තු න්  කර බුන් තුරු දෙස  ව ඩ න
න ද  සු ල ගි න්  ගිරි හිස ගෙන යසි  සැලෙන
ළ ද  සි ද ඹු න්  දකු උඩනැගු යුතු  මූ වි න්

20
දු ල්  මිණි රැසෙ වී දෙව්දුනු කැල්මන් නඳ  න
නි ල්  නුඹෙ ගත වැටෙන පෙර කදු ගැට මනි  න
ම ල්  නැබ ගත් සඳෙහි ගවපල් වෙස් පොර  ණ
පි ල්  කළඹෙ වී පැළඳි දසරුවැ අති සොබ  න

21
ආ ල  කළු නො දත් බැම ඉඟි මුදු පෙමි  න
බා ල  ගෙවිලියන් දෑස දෑස රිසි ලෙසි  න
මා ල  සොනට නැග සී සුවඳින් නෙවු  න
පැ ළ  දිගට වී ගොස් උතුරට වඩ  න

22
නි වි ගි නි  ලැව් පොදින් ගමනින  වි ඩා වූ න
පි ලි ග නි  මෙ තොප "අඹකුළ" බැනි  ව ඩා ම න
ස පැ මි ණි  මිතු කුදුද ගුණ සල  සනා නැන
ගු ණ යෙ නි  වැඩි තුමකු ගැණ තිම  සනා වෙන

23
ර න්  වන් වල් අඹින් විලිකුන් වැසි  කූ ළ ට
ව න්  සප් දරණ පැහැ තොප ගොස් වන්  සා ල ට
ම න්  විසිතර බලන සග වැසියන්  නෙන ට
පු න්  පියයුරක් මෙනි මිහි ලලනගෙ  දූ ර ට

24

ල ද  වනසර රුඳුන ඇති බෙයද "අඹකූ ලේ"
හි ද  මොහොතක් යෙත වින්ද ගිරි පතු ලේ
ලෙ ද  පුද අවසණෙහි ගජමත අළු විසු ලේ
සෙ ද  යව දුක නදිය "රේවා" නම් ළහ ලේ

25

ව න ග ජ තු න්  මද වැද සුවඳින් සුර ම
එ ම න දි යෙ න්  ඔද සිඳි දඹ බෙයෙ වැද ම
රි සි වි ල සි න්  හැරගෙන දිය වී බැර ම
න ද සු ළ ගි න්  නොසැලී වඹනේ වහ ම

26

ඉ ස ඉ ස රෙ න්  තොප යන බක්මී දෙප ස
අඩ කෙ සු රෙ න්  නිල් රන්වන් වෙයි සිර ස
නව කැ කු ළෙන්  කඳුළු දුවි මිහි ගඳිනි ර ස
වෙ න ස කි ඉ න්  දද මුව නා වැඩි සතො ස

27

රෙන්  ගනු සමත් කෑදැති බලමින් පෙළ ට
ව න්  කන කොකුන් ගනිනා ගුගුරන කල ට
ල න්  වී වැළඳි පියගත බිය වැද සිත ට
සු න්  දර සිදුහු ගරු බුහුමන් කෙරෙති න ට

28

නොකා  කුඹුක් කුසුමින් සුවඳවූ නො ම ද
දූ කා  ගිර ගිරෙහි පිල්බර වැඩුණු ඔ ද
කොකා  රැවින් මත්වී කෙළ කෙළ නො ඉ ද
සැ කා  මෙ මට තොප වහ යනුවට සබ ද

29

"ද ස න  දෙසට" යෙන දුනුකෝ කුසුමයෙ න
න ද න  වේය උපවන රන්වන් රුවි න
වි ම න  දෙවොල දද කැදලින් වෙයි ඉදු න
ප ලි න  වේය දඹ හස මනසට සැරෙ න

30

ප ත ළ  දෙසෙහි ගොස් "විදිසා" පුරවර ට
ස ස ල  රළ පෙළැති මුදු බැම ඉඟිති ඉ ට
කොමළ  උවන වැනි "වෙතවති" නදී තො ට
අ ස ළ  මිහිරි දිය බොනු මැන රිසි ලෙස ට

31

ස ම ගි න්  වෙසඹු නුවරැන් මලවි කෙළි කො ළ
නොම දින්  සුරති ගඳ පතුරන "නීස" කු ල
කු සු මි න්  කොලොම් පිරි තොප හද බැතිනි ද ළ
පි ළි ග න්  නියක් වැනී එහි ගිම් නිවා ප ල

32

මං දේ ඉවත වූව ද තගෙ මගිනි ස ර
'ළ දේ නිසුර'ම වැද මතු මගල් තු ර
ලෙ දේ විදුලි ලෙල නෙතගින් බලන ස ර
සොදේ දූතා ලබනු කොත් ලද පල මිතු ර

33

ස ර ස මිණි මෙවුල සුළිනැඹ සැට පැකි ළ
අ ල ස හස ගමන තනබර පුලුළුකු ළ
සු ර ස බස නැතද නිරවිඳි නදිය සා ළ
නොලස බඳ වැළඳ රසපහස විඳ ප ළ

34

පි ය තොප විරහයෙන් තැවී සන්දු නදි ල ද
වි ය පඬුපැහැ පරණ පත් දෙපස තුරු වැ ද
ගි ය කාල ගැන සිතා වැලපෙන ඇය නොම ද
දි ය දී ඔකාද කොට යළි යව පිය සබ ඳ

35

පෙර උදයන සමයෙ පරසිඳු දනන් විසී
සු ර පුරෙන ඩක් වන් නෙත් සිත් කරන විසී
ව ර තර අවන්තී දෙස එකලු සාළු රසී
පු ර සකි විසාලා දකු තගෙ වඩන රිසී

36

ම ද මත් විල් ලිහිණි කන්කළ නද ඇද ම
ම ද මද පිපි පියුම් මල් මූවරද වැද ම
ම ද මරු සිපා නදියෙන් එන අති සුර ම
ළ ඳ මද විඩා සනසයි සලෙලකු ලෙස ම

37

සු ව ඳ සාළු වරල් දූල් කවුළුයෙන් එ න
නො මද දුමින් ගත වඩමින් ගෙසිකි ග න
ස බ ඳ පෙමින් දෙන රඟ දූසා ලතු දියෙ න
බො ළ ඳ පද පැනෙන පහතුළු හිඳ වඩ න

38

ශ ඳ චණි නදිය පිය දිය කෙළු සාළු සුව ඳ
වැ ද එන පවන ලෙල විත උයනැති අන ද
ල ද පුද සඳ මුහුණ ගෙල සදිසැයි සබ ඳ
න ද තිලොගුරු හර පිවිතුරු දෙවොල වැ ඳ

39

අ ව ර න් ගිර සැපත් වනතුරුම දින සා ර
වෙන අන් කාල ගිය ද හිඳ එ දෙවොල පව ර
සැදූ යෙන් මහ දෙවිට සැඳැ පුද කරන ව ර
ලැබ ග න් මහරු තුරු ගොස පිරි පල මිතු ර

40

ල ලි ත  පෙදෙන් හඩවන මිණි මෙවුල්  ද*මා
ස ම ත  රඟන තලඟන ගෙන සෙමෙර  ර මා
න සි ත  ලෙසට පොද දී ගත නිවන  ගි මා
බ ල ත  මෙතොප අඬැසින් වැනී බමර  ද මා

41

න ව බ ඳු ව ද  මලක් මෙන් සැඳෑ රැසිනි ර  ත
තොප මසබඳ  සඳ කඩ උරතල වස  ත
ගජ ස ම හැ ඳ  රඟනුවස් වැඩි ලෙසිනි තෙ  න
වැඩි සි ත න ඳ  ගිරිඳු හරදෙස හෙළසි ඝන  ත

42

ත ද  ගන දුරෙහි එ පුරෙගි ලාලන  ල ල න
ස ඳ  යන ගිම්හු වෙත සමහන් සැප  රි සි න
ම ද  වත් තොා කොට ගිගුරුම් රන්දම්  සි රි න
සොඳ  මුදු විදුලියෙන් මඟපෙන්වව  සා ල න

43

සැ න සු න  විදුලි ඇති රැ මෙතොප එම පු  රේ
නි දි යෙ න  මඳක් පාරුපතැ ති පහතු  රේ
වැ ස දි න  සාර සමග නැඟි තිදි ගැට දුරැ  රේ
ය ව මැ න  මිතුරු කිස කරනා සබඳ යු  රේ

44

ඇ සා  කඳුළු හරනට සිය කොමළ සා  ල
ලෙසා  අරුණ වෙත එන හිම් පරඹු ලො  ල
න සා  ලන කඳුළු පිණි එන මුව කම  ල
රැ සා  නසන රිවි තට ඉසි කෙරෙයි ද  ල

45

ව න් ස ඳ  නිමල්ගඟ වෙත නම් යුත් ශෑඹ  ර
ම න් න ඳ  තොප වැටෙන සේයා එහි රුසි  ර
ඉ න් ලෙ ද  කුමුදු පෙටි පෙරලෙන බැලුම් ස  ර
ම න් බැ ඳ  රුදෙන්නට නොතරම් වෙසි මිතු  ර

46

අ නි න්  දියට නැමි එනදියෙ අතු සුනි  ල
ලෙසින්  මදක් ගත්කල මුදු සළු සලි  ල
ප ස න්  තොට නිතඹ පෙනෙනා සඳ තොම  ල
ග ම න්  කෙරෙද කවරෙක් රිසි සොළ අව  ල

47

වැ ද  නගෙ දිය බින්දු මිහිතල විය ගඳි  න
ඔ ද  වැඩි වරණ දෙන නදයෙන් වුණු නද  න
වැ ද  වැද සිහිල් පිවිතුරු මද මරු හම  න
න ද  දෙව් ගිරි කුලට යාගන් සකි කාල  ණ

48

සමර සැරිනි හර හැරි ගිනිමුවෙහි වෙ ර
අසුර බිඳිත ලෙදවත් තිති වැසි එගි ර
කුමර සිකි යහන් දිය ගෙන ගඟිත්'ම ර
මිතුර කුසුම් වැස්සෙන් නහවව පව ර

49

නද දරු පෙමින් නිලුපුල් ලත කණ රුසි ර
ගෙහ බවන සිළින් ගිලිහුණු ගිරිඳුව පව ර
හරසඳ රු සිත් සුදු නොතැගැති කඳ මයු ර
අනතුරු ගිගුම් කොට නටවනු මැන මිතු ර

50

රැද සඳ කුමර යන තොප වෙණගත් අති න
සිද් ඹුත් සමඟ මගහරි පොද ගැන බියෙ න
ලෙද නදී මිහි සුසැදි බිලි කළ දෙන් ලෙසි න
රද රන් තිදෙව් යස පුදනට ලස නොව න

51

සොරු ගුරුළු දද පැහැගත් තොප සබ ද
උරු ගැනුම ලෙස දිය එහි පැමිණී ස ද
දුරු සිට බලන සඟ වැසියනට න ද
හරු ලෙස පැනෙයි ඉඳුනිල් ඇවුණු මැ ද

52

එසින් තෙරව ගොස් දස පුරයෙහි ලක ල
නුවන් නදන කොද පිරිවැරු බමර වැ ල
ලෙසින් උදුල ළඳ ලියහට අති කොම ල
නුබින් පෙනි පෙනී පිය සකි සඳිති ප ල

53

කඹර තුළට තද පොද නා දෙවන ලෙ ස
රුදුර රද පැමිණී මුව විද සැර සහ ස
සමර කළ අඳුන පෙර කුරු සෙනඟ ය ස
මිතුර වඩින් පසුකර බඹ සෙව් පෙදෙ ස

54

නැයන සුදෙහි බලදෙව් මැදහත් කාමින
ලාලන රේවතිය නෙත් පිළිබිඹු සැදුන
ලංබොන සුරා සෙව් සරසවි නදී දියෙන
නායන මැනවි ඇතුළත පිවිතුරු වෙමින

55

හිමං ලයෙන් කනකල කුළ'සළට බ ට
අමං පුරට ගිනවුන සාගර ගො ට
කමං රුපු මතෙහි වැද පෙනිණි හස කො ට
උමං වෙහෙස වන යව බාරුසි ගඟ ට

56

නි ම ල් ඒ අඹරගඟ පිවිතුරු නද නා
තලෙල් විනම් දියබොන ලෙස බට සඳි නා
ළ කා ල් නසේයා සුර ගජ මේන් පැනෙ නා
එ කා ල් නිරද සඹුනා බැඳි වැනි නොතැ නා

57

නැඹි න් සුවඳ කස්තුරි මුව ගල් තෙලෑ නි
හි මි න් වැසුන ගිරිකුළ මත සුදු පැහැ නි
ගි ම න් නිවන ලෙස මොහොතක් සඳ තැව නි
ය ග න් ඉසුරු නෙල ගව ගත් කලල් යු නි

58

වැ ද වැද පවන ගැටුමෙන් නිති සරල තු ර
ත ද ලැවි ගින්න නැඟි දමනා වල සෙම ර
න ද එම හිමාලය පෙළනොත් සහස් සැ ර
පොද දී සනසමින් නගමන කර මිතු ර

59

ම ද දිය වගන මත් මතභෙකැ තොප ගොස ට
ර ද මුව එඩි සිතින් වන් සඳ ලෙන් පිට ට
බි ද ගත පහන් වැස්සෙන් උන් කර නිව ට
ද ද නැත සිදු නොවන සුරු පෙන්වන් ලොව ට

60

ප න ර සුරන නිති පුද දෙන කර අද ර
සොඳු ර ගල් තෙලෙහි සැදි පව් නසන ව ර
රු දු ර පද ලකුණ පැදකුණු කර පව ර
අ ජ ර අමර ගණ සිරි ලැබගන් මිතු ර

61

කා න් කළු මියුරු නදදෙන වෙණ පවන වැ ද
තු න් පුර විජය උර හර ගැන වැඩුන ඔ ද
කි න් නරඟන ගයන ගී මිහිඟු බෙර න ද
මෙ න් නො ද දුනොත් නද සර හර රූහුම ස ද

62

පෙර බිහුරුම යසසට මගවුන අම ර
ෂදුර හස කොන්ස ගිරි සිඳුරෙන් තුඟු පව ර
න ර සී පදස මෙන් දෙස හැරී බලි අසු ර
ප ර වැඩ රිසින් යව උතුරට ඉටු මිතු ර

63

පොරණ රවුළුහට සෙලවිය නුහුන ත ද
ද ප ණ සදිසි සුර සුන්දරියන්ට න ද
බ ර ණ සඳ හසසෙ තුඟු කුලෑ නි සරි නො ද
ව ඩි න මැන කෛලාස ගිරියට පිය සබ ද

64

අ දු න්  සාවෙක පැහැගත් කැපු සිනිඳු කො  ච
නා දු න්  මෙතොප ලුංවෙන හෙළු ගිර මෙන  ච
අ ව න්  රජහු දසරුම වයමින් රුව  ච
නුව න්  පිනයි නිල් සළුවක් ඇඳි ලෙස  ච

65

ම ත්  ව සොළු දෙලෙන් සප්වල පැර එකු  ළු
යෙත්  නාම් උමාහර අනගෙන පදෙනි ලො  ළු
සු ත්  දිය ඇතුළු දූබිතොට ගෙන බැහිති ද  ළු
වෙත්  මැන ගිනක් නැහුමට මිණි කුලට දු  ළු

66

ල ල  ලාලන පුරකල ගිම් හිසා නැ  වී
ව ල  මිණිවලින් ගවමින් දියගෙන නද  වී
ලොල  කෙළි දෙලෙනි නට යා නුදුතොත් ගැල  වී
ද ල  ගිගුරුමෙන් උන් බිය කර යනු මැන  වී

67

ද ල ද ර  මෙතොප හෙම් තඹරෙන් වැසි නද  නා
පි සි යු ර  රැගෙන දිය මානස නම් විලෙ  නා
නා ද කර  ඇසිල්ලක් එරවන දී පව  නා
සු ර තු ර  ලපළු සළු ලෙලවා කෙළි කෙළි  නා

68

මු තු දු ල්  ලමින් ගෙතු අඟනක කියඹු  සරි
තොපකල්  වලා වැදි තුඟු පහ පෙළිනි  පිරි
කරලොල්  අඹුරු සළු ඇඳි මියුලැසක  සරි
ම න ක ල්  පුරට වඩු අලකා පිරුණ  සිරි

69

ගිගු රු ම්  මිහිඟු බෙර විදුලිය ලලිත ක  ළු
සි තු ව ම්  සුරිඳු සැව් ඇතුලන පිහිටි ද  ළු
න ද බි ම්  මුවා ඉඳුනිල් තුඟු කොතිනි දු  ළු
ම න ර ම්  එපුර පහ තොප සම වෙති ලක  ළු

70

ලී ල  කමල අත සවනත මහරි ම  ලී
බාල  කොඳ කියඹු බක්මී මැද වර  ලී
ආල  වදන් ලොත්රෙන් කුරවක මුහු  ලී
බාල  නන එපුර බල සැරසුන ලක  ලී

71

සැ ම ක ල්  සුපිපි තුරු වැසි මත් බමර මු  ළු
පි පි ව ල්  තිති හසන් පෙළ කළුමිණි මෙවු  ළු
සි කි පි ල්  හඹා රැව්දෙන තිති අඳුරු මූ  ළු
සු ව ම ල්  සඳරැසින් හළු එපුර සිත් කා  ළු

72

සතුටින් මිස කඳුළු අන්කිසි ලෙසින් නෑ — ති
මනයොන් සැරෙන් මිස ගත වෙහෙසුමක් නෑ — ති
පෙමයෙන් දුකි විනා අන්කිසි කලහ නෑ — ති
යොවුනෙන් නොපිරිහෙන බූ එහි වසත රෑ — ති

73

කොමල උතුම් කල් සහ එපුර යක් රැ — සේ
අතුල කුසුම් සරිතුරු මිණි බිමෙහි දි — සේ
ලකල සඳළු වැද විඳ මිහිරි තුරු ගො — සේ
නිමල අමරතුර මී බොන කැමති ලෙ — සේ

74

සුන් දර යොවුනගත වැද එන අඹුරු — සූ බ
මන් මරු විඳ මදුරු තුරු සෙවන — ලෑ බ
රන් වැලි ගැසීමෙන් වැසි මිණි සොයා — ලෑ බ
ඝන් තොස කෙළි කෙළිති නිති සිතු වඩා — ලොබ

75

සොම් පල සදිසි නොලබර නිතඹ සියුමැ — ලි
පෙම් බර කොමල කල හැඳි සැම දුහුල් පි — ලි
කාමි දෙව් විදි සලෙල ගත්කල වැදම වි — ලි
යම් පල නැතද වත්සුණු මිණි පහනෙ ගෙ — ලි

76

පවතින් මතු මහල් පැමුණුන දල දර — න
පොදයෙන් නසා විසිතුරු සිතුවම් කල — න
සැකයෙන් කිමෙකැ සිතතුළ තද බිය වෙමි — න
සොරෑමෙන් සිදි බිඳී වහයසි දුම් වෙසි — න

77

කෙළිකොල අවල වෙහෙසට ගත පත් කොම — ල
පියකල එපුර සැනසෙන සිරි යහන් ව — ල
නැබුදුල මහරු සඳකාන මිණියට දුහු — ල
ගෙනදල ගිම් නිවා ගත සනසන ලකා — ල

78

නිදන් අනෙක නිම කළ නොහැකි ඇතිස — ර
නිතින් සලෙල දිව වෙසඹුන් ගෙන එපු — ර
නොමින් කුවෙර යසගයනා සහ කිනු — ර
පසන් උපවනට පිවිසෙති ඔකඳ කා — ර

79

සවතින් හුණු රුවන් පියුමෙන් බිඳි — පතින
ගමතින් මදුරු මල් මුහුලින් — සැලුන
හුයසුන් හරින් හිස පළඳින මුතු — දලින
වෙසඹුන් මඟ මෙයයි දූතගත හැකා — අරුණ

80

කුවෙර සබඳ සඳ කඩ එපුර වැසි නි සං
ස ම ර බමර සැර හැර දැමූ නමුදු තො සා
අ ද ර බොළඳ සුලලිත කොමළ මියුලැ සං
ස ම ර සැර කිරිය කළෙ බැම නෙතිනි ය සං

81

දෙ න ය න අඳුන තොල සරසන පැහැ නද න
ස සො බ න රුවැති සුසිනිඳු සළු පිළි බර න
කා ර ව න මනවිසී ලතු පද සර සද න
රි සි මෙ න සුරතුරින් ගෙන එහි ලිය සැරේ නා

82

කි නු රි ඳු විමන බඳ උතුරින් පිහිටි ස ර
දූ නු ඉ ඳු සරි රුවන් තොරනින් දිලි මස ර
නැතුපැල මදුරු තුර පිපි උයනෙ පෙ ර
දනු මැ න අප නිවස සිරිපිරි අලකා පු ර

83

වැ ඩූ න සතොස හස තොප දුටු මනස වි ල
ග ම න අතැර වැසි පස් පියුමෙන් ලක ල
නා ද න පඬි පෙළැති මරකත මිණිනිඳු ල
ඈ දි න ගනුව සකි දුටු මනරම් ගෙවි ල

84

එ ම වි ල් තෙරෙහි රතරඹ වනිත පිරිවැ රැ
ඉ ඳු නි ල් මිණින් කළ කුළු සහිත විසිතු රැ
මගෙ කල් කෙළි දෙලෙන් පසුවන සෙල සොඳු රැ
තොපදුල් විදුලි රුඳි දුටු සිහිවෙසි මිතු රැ

85

බැඳි කුරවක යොහොඹු ලිය මඬුවට අස ල
සු දි ලෙන ලපල'සෝකා පිය පහස ලො ල
වි දි නට දෙතොල මී පිය මාසේමක ල
සැදි තුර කෙසර දකු අප උයනෙහි ලක ල

86

මැ ද එම කෙසරසෝකා පුවරුවෙ අ ම ල
බ ඳ රත්යටික මරකත මිණියෙන් ල ක ල
ල ඳ වල නදින් නැටි-විසි සැඳැගෙල සු නි ල
මෙද සළකුණෙකි අස තව සකිසඳ කොමල

87

ඇඳිදෙර පසෙක යක්රූ නම් සක් පියුම
ම න හර අප නිවෙස දකු මැන කර නියම
ලෙසගිර අවරගිර පත්සඳ වන පියුම
සි රි ස ර එහි මදය මගෙ වියොවින් බැරම

88

සැනීන යන පිණිස දලගත හැර ලමින
රැගෙන කළඹ වෙස හිඳ කෙළි සෙලෙ රමන
සෙමින මද විදුලි රැලි හැර හැර නයන
බලන මැනවි අප විමනත තුළ කළන

89

සිහිනිග බර නිතඹ ලෙස ගමන සියුමැ ලි
නෙතුම්ග නයන දත් මුතු ගැඹුරු නැඹ දි ලි
පියයුග මදක් නැමි රතු දෙතොල බිඹු ස ලි
කොංමළග දකු පළමු බඹ මැව් ලියසෙ දි ලි

90

හිමි ගෙන් වෙන්වූ සක්වා ලිහිණි පියයු ර
වියොවින් දුබල දිවි සරි මගෙ පිය සොඳු ර
හිම යෙන් නැවුන සරසක යුර කල සිසි ර
රුසිරෙන් දූත් පිරිහි ඇතියයි හගිම් ස ර

91

නිතර සුසුම් හෙලමින් පිය තොල කොමල
සතිර වියලි ඇත නද නෙත් යුග ඉපිල
වැතිර කියඹු ඇති අත තැබු වත දුබල
අයුර සිතම් තොප වැසි සොම් සඳ මඩල

92

නැවත සමාගම වන ලෙස දෙවි යදි න
එනැත අදින මාරු හෝදල සොවි න
පුවත අපගෙ සැලලිහිණිය සහ බෙනෙ න
දකින මැනවි සකි මගෙ පෙම්බර ලල න

93

**වෙණ කබමින් ඇඟෙකි වැසි වැරහැලි වලින**
**හෙණ කඳුලැලි තත් මත පිස පිස ලමින**
**ගුණ ගී මෙමා ගැන ඇස බැඳි ලෙස ගසන**
**වෙන නැන බලව සිහිකර කර දළ සොවින**

94

විරහින සිරිත මෙන් වසනට සිතු සැනහී
එනදින ගණන සිහිකර කර එලි පතෙහී
ගැණගැණ කුසුම් තබමින් හෝ සිය සිතෙහි
රිසි මෙන මං සමග තුටු වෙන දකු විරහි

95

ගෙවතක් දවල් කල බලි පුද ඇ දෙසින
නිදිවත් නැත රැයට සිත දළ දුක් බැවින
හිතවත් සබඳ එහෙසින් නිස කල ලලන
සුමපත් කරන්නට බල දී මගෙ හසුන

96
අඹසඳ ලෙසින් රූ සපුවෙන් පිරිහි ය   න
හෙවඑක ඇළිත් බිම විරහින් සුසුම් ල   න
නෙතකඳුලැලින් සිහි කෙරෙමින් පෙර හඬ   න
ස කි ස ඳ බලන් සනසන්නට මපියග   න

97
සැරසිලි හැරි කියඹු දික්වූ තෙක් කපො   ල
සියුමැලි අදර පහරන සුසුමින් සස   ල
මන කලි සමාගම සිහිනෙන් වනසෙ ලො   ල
කඳුලැලි පිරිනෙතින් නැති නිඳි පනයි ක   ල

98
වෙන් වන දිනෙහි මල්පටි අත්හැර වර   ල
බ න් වෙණි මිදිය යුතු යලි මා පැමිණි ක   ල
සු න් දර වතින් නිය නොම කැපූ අතින් ද   ල
න න් වර උඩ නගන්නී මගෙ කල කොම   ල

99
ක ද ගනවලා ඇති දවසක නොම පිපු   න
නොද හැකුළුන පියුම් සරසක සිරි සිරි   න
ස ඳ රැස් අම සිහිල් එන දූල් කවුළුයෙ   න
ල ද ඇසිපිය කඳුලෙන් බරවී නැමෙ   න

100
ස ක ල බරණ හැර සියුමැලි කොමල ග   ත
දූ බ ල බැවිනි තබමින් යහනෙහි හෙ   ත
ප බ ල විරහ දුක් විඳිනා පිය එක   ත
එ ද ල කඳුළු නොපගෙන් සලවනු නිය   ත

101
අ න හැ ර අවෙන් වැඩිවන නිබඳම සිහි   වි
පි ය ද ර මම දනිමි මට ඇති මගෙ ගිර   වි
කි සි ව ර නොසිත බෙනෙමියි බොහො දෙඩමලු   වි
සොහොයුර නොබෝ කලකින් නුඹටම දූනෙ   වි

102
ම හ සු න් රැගෙන මියුලැස වෙනවන්   ස ඳි න
අඳු නෙන් නොර අලක රොදයෙන් කොන   වැ සු න
වි ල සි න් සුබ නිමිති සැලෙනා වම්   න ය න
සොබ මන් නිළුපුලක් වැනි මින් වැද   සැලෙන

103
සු ර ති වෙහෙස දුරු කරනසෙ මැඩි   අ නි න
නොමැති බොහෝ කලකින් මුතු දූල්   ර සු න
පැ හැ නි රඹකඳසෙ වම් වටොරද   සොබන
නි ම් නි පෙර සිරින ලෙලදෙයි පිය   ක ල ණ

104

මෙ සේ  නිමිති දූත මගෙ පෙම්බර බොළ  දී
තොසේ  වී මදක් වත් ලදහොතින් නි  දී
ගො සේ  නොකර පුබුදින නෙක් හිඳු පැහැ  දී
ර  සේ  පහස වරදිසි සිහිනෙන් පිබි  දී

105

අ ළු ය ම්  කලෙහි මාලති කැකුළු ලෙස  ර මා
මගෙපෙම්  බර කොමලි පුබුදින විදුලි  ද මා
සැග වු ම්  කොට සනසමින් මුදු සුළඟ  හ මා
ම න ර ම්  බසින් කිය මතු දෙන හසුන  මෙමා

106

පෙම්  බර ලියන් වෙත යන සැමිහු මගරැ  දී
ගු ම්  දී සුහු කරන විරහින් වෙත ළබැ  දී
පෙම්  හසුනක් රැගෙන ආ තොප වෙත පැහැ  දී
ම ම්  දල දමරම් තොප හිමි සුමිතුරැ බොළ  දී

107

ර ස  බස මෙසේ පවසන තොප පිය කොම  ලි
ලෙස  රම සීතාවී හනුමා හමුවූ ක  ලි
දෙස  තොප සවන දෙනනරඹන තුටින් පි  ලි
ර ස  සුත් ගෙනා හිමි මිතු හරි ලද තැවු  ලි

108

සන ස න  ලෙසින ඇය මගෙ සුමිතුර  ප ර ම
සැ ම දි න  දුකින් වෙන්වූන ඇය සිහි  සා ර ම
කිය මැන  වෙසෙන බව රම්ගිරියෙහි  මෙ මම
මෙ ම දන  විපත් පැමිණියවුන්හට  සු ර ම

109

ලෙ සින්  කම් විරහ වුනමුත් බඳින්  බඳ
හොතින්  කඳුලු පිරි නෙත් කඳුලෙන් තෙ  තද
ග නි න්  ගතද නැගැයෙන් නැහැයද බො  ළද
මු වි න්  මුවද කිය සිපගත් බව වැ  ලද

110

ර හ ස්  නොවන කියහැකි යෙහෙළින් මැද  ද
නි දෙ ස්  වදනා වුව මුව පහසට ළ බැ  ඳ
ර හ ස්  ලෙස කියනු ලොල ඔහු දුක්ව ගි  ඳ
මෙලෙස්  කිය මට තොපහට කියන ලෙ  ද

111

ග න  සමිවැල්හි ලෙල මිසුලැසෙනි  බැ ලු ම
ව න  සේකරෙහි තුඹු ගඟ තරඟෙහි  දෙ බැම
ඈ න  මුදු වරල සිරි ඇස් පිල්නි  මෙ සැම
නැ ස  එක දෙසෙහි අහො නිගෙ සැම රුව  සු ර ම

112

ඇ ඳ   තොප රුසිරු රුව හිඟුලෙන් ගල් තෙලෙ   ක
පු ද   යුග වැලඳ ගෙන සිඹිනට සැදි සඳෙ   ක
ඉසද   වත් කඳුලැලින් පිරිගියෙනි නෙත් දෙ   ක
ඒ ද   බැරි විය අහෝ! මෙය රුදු කරුමය   ක

113

බොළඳ   මෙතොප දූත සිහිනෙන් තුරුළු ක   ර
වැ ළ ඳ   ගැනුම ලෙස අත දිගුකර එව   ර
නොමද   විඳින දුක දූත දෙව් වැසි මෙගි   ර
නි බ ද   සලති කඳුලැලි පිණි ලපළු තු   ර

114

බි ඳ   ගෙන ලපළු මුව දෙව්දුරු කිරි වැද   ම
නද   සුවඳින් යුතුවූ හිමගිරි කුළු පිස   ම
ම ද   මරු එන දකුණු දෙසයෙන් තොප සුර   ම
වැද   ගත එතැයි ලොබ කොට සිප ගනිමි ම   ම

115

දි ගු ය ම්   ඇති රැයෙහි දුක්විඳ අරුණ වු   න
ප සු ය ම්   සැපෙක් වෙද එය ඒවත් දරු   ණ
මගෙපෙම්   බරිය ලෙලදෙන ඇස් ඇති නඳ   න
ම ට න ම්   සැපක් නැත වෙන් වූයෙන් තිගෙ   න

116

දූ න්   මේ තොපද මා විලසම අති   රුදුර
වෙන්   වී විඳිනා මුත් දුක කලණියෙ   රුසිර
මෙන්   රිය සක දුක සැප පෙරලෙන   නිතර
ර න්   රස විලස යලි එක්වේන බව   ස තිර

117

හ රා   කරිපු නත දරණින් නැගෙන   මෙමා
දු රා   හැරෙයි පව සිව්මස ගෙවා   ද මා
ස රා   සඳ රැසින් ඔද වැඩි රැයෙහි   අ මා
නුරා   සැප විඳිමු වැඩි සිතු විලස   ර මා

118

වැ ල.ඳ   මගෙළ පෙර තොප නිදියෙන   පි බි දී
නොමද   දුකින් හඬනට වන්සඳ   බොලදී
කි ම ද   අසන සොර තොප අහනක්   වැ ළ දී
ඔ ක ඳ   වෙනු දුටිම් සිහිවෙයි කීව්   ප රි දි

119

එහෙ සි න්   මෙමම ගැන දුර වුන කිසී   ලෙසිනි
නොකරන්   සැකක් මගෙ පෙම්බර නිල්   න ය නි
වීයො වින්   සුරසිරස කලකින් නොවී   ඳි යෙනි
නොමඳින්   වැඩෙයි දින දින පෙමදර   නි නි නී

